# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මැතිවරණ වියදම් නියාමනය කිරීමේ

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත; 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත; 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමක ම හෝ මැතිවරණයක ම අපේක්ෂකයන් විසින් දරනු ලබන වියදම් නියාමනය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 දෙසැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 නොවැම්බර් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[163 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 20.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මැතිවරණ වියදම් නියාමනය කිරීමේ

එල්.ඩී.—ඕ. 30/2018

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත; 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත; 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමක ම හෝ මැතිවරණයක ම අපේක්ෂකයන් විසින් දරනු ලබන වියදම් නියාමනය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක ................. දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මේ පනත අදාළ වීම

**2.** මේ පනතේ විධිවිධාන-

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත;

(ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත;

(ඇ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත; සහ

(ඈ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත,

යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකට ම හෝ මැතිවරණයකට ම අදාළ විය යුතු ය.

අවසරලත් මුදල

**3.** (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ ඡන්ද විමසීමක් හෝ මැතිවරණයක් පවත්වන ලෙස නියම කරමින් කරන ලද ප්‍රකාශයේ හෝ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති නාමයෝජනා භාරදීමේ කාලසීමාව අවසන් වීමෙන් පසුව, මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ වෙනත් අපේක්ෂකයන් විමසා, ඒ ඡන්ද විමසීම හෝ මැතිවරණය සඳහා වන අවසරලත් මුදල, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කිරීමේ කාර්ය සඳහා භාවිතයට

ගැනීමට ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ශ්‍රී ලංකා රුපියල්වලින් යම් මුදලක් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති අවසරලත් මුදල පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:-

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඡන්ද විමසීම සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකින්, ඡන්ද විමසීම පවත්වනු ලබන පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් බල ප්‍රදේශය තුළ ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින්;

(ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඡන්ද විමසීම සඳහා ශ්‍රී ලංකාවේ රුපියල්වලින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකින්, අපේක්ෂකයා තරග කරනු ලබන පරිපාලන දිස්ත්‍රික්කයේ ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින්;

(ඇ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ මැතිවරණය සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකින්, අපේක්ෂකයා තරග කරනු ලබන සියලු මැතිවරණ දිස්ත්‍රික්කවල ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින්;

(ඈ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, (1) වන උපවගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඡන්ද විමසීම සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කරනු ලැබිය හැකි යම්

මුදලකින්, දිවයිනේම මැතිවරණ දිස්ත්‍රික්කවල ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින්.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණනය කරන ලද අවසරලත් මුදල ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අපේක්ෂකයකුගේ මැතිවරණ වියදම් මත සීමා පැනවීම

**4.** (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී යම් අපේක්ෂකයකු විසින් ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළව අවසරලත් මුදල ඉක්මවා වියදම් දැරීම නොකළ යුතු ය.

(2) යම් ඡන්ද විමසීමකට හෝ මැතිවරණයකට අදාළව අවසරලත් මුදල ඉක්මවා යම් අපේක්ෂකයකු වියදම් සිදු කරනු ලබන අවස්ථාවක දී, 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නීතියක අර්ථානුකූලව පවත්වන ලද එවැනි යම් ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන අතර, ඒ අපේක්ෂකයා විසින් එම වියදම් එම අපේක්ෂකයාගේ යම් අනුදැනුමක් හෝ අනුබල දීමක් නොමැතිව සිදුකළ බවට ඔප්පු කර ඇත්නම් මිස, නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සම්බන්ධයෙන් ඒ නීතිය යටතේ පනවනු ලැබ ඇති දණ්ඩනයකට ඔහු යටත් විය යුතු ය.

ඇතැම් පරිත්‍යාග පිළිගැනීම තහනම් බව

**5.** (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී යම් අපේක්ෂකයකු විසින්-

(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින්, පොදු සංස්ථාවකින් හෝ යම් කොටස් ප්‍රමාණයක් රජය විසින් හෝ පොදු සංස්ථාවක් විසින් හිමිකාරිත්වය දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වෙතින්;

(ආ) විදේශීය රාජ්‍යයකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පුද්ගල මණ්ඩලයකින්;

(ඇ) සෘජුව හෝ වක්‍රව විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද යම් සමාගමකින්; හෝ

(ඈ) අනන්‍යතාවය හෙළි නොකරන ලද යම් තැනැත්තකුගෙන්,

ඒ අපේක්ෂකයාගේ තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ තෝරා පත්කර ගැනීමට ඉඩ සැලසීමේ කාර්යය සඳහා මුදලින් හෝ ද්‍රව්‍යමය ආකාරයකින් ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් ලැබුණ ද ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් පිළිගැනීම හෝ භාරගැනීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් අපේක්ෂකයකු ඒ ඡන්ද විමසීම හෝ මැතිවරණය පවත්වන ලද 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නීතියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන අතර, නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සම්බන්ධයෙන් ඒ නීතිය යටතේ පනවනු ලැබ ඇති දණ්ඩනයකට ඔහු යටත් විය යුතු ය.

අපේක්ෂකයා විසින් භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්වය සහ දරන ලද වියදම්වල වාර්තා භාරදිය යුතු බව

**6.** (1) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක හෝ මැතිවරණයක සෑම අපේක්ෂකයකු විසින් ම, ඒ ඡන්ද විමසීමේ හෝ මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කළ දින සිට දින විසි එකක් ඇතුළත, ඒ අපේක්ෂකයාගේ තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීම හෝ තෝරා පත්කර ගැනීමට ඉඩ සැලසීම සඳහා-

(අ) ඒ අපේක්ෂකයා විසින් හෝ ඒ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගත් හෝ භාරගත් සියලු පරිත්‍යාග හෝ දායකත්වයන් පිළිබඳ වාර්තාවක්; සහ

(ආ) ඒ අපේක්ෂකයා විසින් හෝ ඒ අපේක්ෂකයා වෙනුවෙන් දරන ලද සියලු වියදම් පිළිබඳ වාර්තාවක්,

(3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ බලධරයන් වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "එම ඡන්ද විමසීමේ හෝ මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන දිනය" යන්නෙන්-

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට ඒ ආඥාපනතේ 66 වන වගන්තිය යටතේ;

(ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට ඒ පනතේ 60 වන වගන්තිය යටතේ;

(ඇ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වන ලද මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට ඒ පනතේ 62 වන වගන්තිය යටතේ; සහ

(ඈ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට ඒ පනතේ 64(2) වන වගන්තිය යටතේ,

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන දිනය අදහස් වේ.

(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති වාර්තා, අපේක්ෂකයා විසින්-

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන් සභාවට ද පිටපතක් සහිතව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත;

(ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන් සභාවට ද පිටපතක් සහිතව අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධරයා වෙත;

(ඇ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන් සභාවට ද පිටපතක් සහිතව අදාළ මැතිවරණ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධරයා වෙත; හෝ

(ඈ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන් සභාව වෙත,

භාර දෙනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් වාර්තාවේ-

(අ) ඒ අපේක්ෂකයා විසින් හෝ ඔහු වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ සියලු පරිත්‍යාග හෝ දායකත්වයන් සහ එම පරිත්‍යාග හෝ දායකත්වයන් ද්‍රව්‍යමය වශයෙන් ලැබුනේ නම් ඒ පරිත්‍යාගවල හෝ දායකත්වයන්ගේ ඇස්තමේන්තුගත වටිනාකම;

(ආ) ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් භාරගනු ලැබූවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග; සහ

(ඇ) ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් සිදුකරන ලද තනි පුද්ගලයන්ගේ හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල අවස්ථාවෝචිත පරිදි, නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ලියාපදිංචි අංකය,

සඳහන් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වාර්තාවේ-

(අ) ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළ වන ප්‍රචාරක දැන්වීම්, අත්පත්‍රිකා, ධජ, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර හෝ පෝස්ටර්, මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, ඇලවීම, ප්‍රදර්ශනය කිරීම හෝ නිරූපනය කිරීම සඳහා;

(ආ) ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කිරීම සහ ගුවන්විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රචාරය කිරීම සඳහා;

(ඇ) ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර පුවත්පත්වල, වාර සඟරාවල හෝ වෙනත් ප්‍රකාශනවල ප්‍රකාශයට පත් කිරීම සඳහා;

(ඇ) ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළ රැස්වීම් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයන් හෝ උපකරණ කුලියට ගැනීම හෝ භාවිත කිරීම සඳහා;

(ඉ) අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහන කුලියට ගැනීම සඳහා වන වියදම් හැර ඒ ඡන්ද විමසීමට හෝ මැතිවරණයට අදාළ කටයුතු සඳහා වාහන කුලියට ගැනීම සඳහා; සහ

(ඊ) ඒ වාහන ධාවනයට ඉන්ධන සැපයීම සඳහා,

ගෙවීම් සිදුකළේ ද නැද්ද යන්න පිළිබඳව තහවුරු කරන බිල්පත් සහ කුවිතාන්සි සමඟ ඉහත සේවාවන් ගෙවීමක් රහිතව ලබාගෙන ඇත්නම්, එම සේවාව ලබාගත් තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ද ඇතුළුව, අපේක්ෂකයා හෝ ඔහු වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් කළ යුතු ය:

එසේ වුව ද, අපේක්ෂකයා විසින් හෝ ඔහු වෙනුවෙන් -

(අ) ඡන්ද විමසීම හෝ මැතිවරණය පැවැත්වෙන ප්‍රදේශය තුළ අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු සඳහා; සහ

(ආ) ලිපි ද්‍රව්‍ය, දුරකථන හෝ වෙනත් ආකාරයේ සන්නිවේදන කටයුතු සඳහා,

දරන ලද වියදම්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද වාර්තාවක ඇතුළත් නොකළ යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තා අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතු අතර, ඒ වාර්තාවල තොරතුරු අපේක්ෂකයාගේ දැනීමේ හැටියට සත්‍ය සහ නිවැරදි බවට අපේක්ෂකයා විසින් අත්සන් කර සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයකින් සමන්විත විය යුතු ය.

වාර්තා සහ ප්‍රකාශන ලැබුණු බවට අදාළ දැන්වීම ප්‍රකාශයට පත් කිරීම

**7.** (1) 6 වන වගන්තිය යටතේ අපේක්ෂකයන් විසින් භාරදෙන ලද වාර්තා සහ ප්‍රකාශන ලැබීමෙන් පසුව -

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, 1988 අංක 2 දරන පළාත්

සභා ඡන්ද විමසීම් පනත යටතේ හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් හෝ මැතිවරණයක් සම්බන්ධයෙන් වන විට, අදාළ තේරීම්භාර නිලධරයා විසින්; සහ

(ආ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වන විට, මැතිවරණ කොමිෂන් සභාව විසින්,

දැන්වීමේ නම් සඳහන් අපේක්ෂකයන් විසින් භාරදෙන ලද වාර්තා සහ ප්‍රකාශන ලැබී ඇති බවට සහ ඒ වාර්තා සහ ප්‍රකාශන යම් තැනැත්තකුට පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය සහ වේලාවන් දක්වමින්, අවස්ථාවෝචිත පරිදි තේරීම්භාර නිලධරයා විසින් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් අවම වශයෙන් එක් පුවත්පතකවත් දැන්වීමක් පළකිරීමට සැලැස්විය යුතු ය.

(2) තේරීම්භාර නිලධරයා සහ මැතිවරණ කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ පළකළ දැන්වීමේ සඳහන් ස්ථානයේ දී, සහ ඒ වේලාවේ දී අපේක්ෂකයකු විසින් භාරදුන් වාර්තා සහ ප්‍රකාශනය පරීක්ෂාකර බැලීමට අවසර දිය යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි පරිදි යම් මුදලකින් ගාස්තුවක් ගෙවීමෙන් ඒ වාර්තාවල හෝ ප්‍රකාශනයේ පිටපත් ලබා ගැනීමට ඒ තැනැත්තාට අවසර දිය යුතු ය.

(3) තේරීම්භාර නිලධරයා සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලැබුණු වාර්තා සහ ප්‍රකාශන සියල්ල ඒවා ලැබීමෙන් පසු මාස හයක කාලසීමාවක් සඳහා ආරක්ෂා කර තැබිය යුතු අතර, ඒ කාලසීමාව අවසානයේ දී ඒ වාර්තා සහ ප්‍රකාශන විනාශකර දැමිය හැකි ය.

නීති විරෝධි ක්‍රියා පිළිබඳ වරද

8. 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී-

(අ) සාධාරණ හේතුවක් නොමැතිව, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන; හෝ

(ආ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද යම් වාර්තාවක හෝ 6 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද ප්‍රකාශනයක සාවද්‍ය බව ඒ තැනැත්තා විසින් දැනුම්වත්ව හෝ සාධාරණව දැන සිටිනු ලැබිය හැකි ප්‍රකාශයක් වන්නා වූ යම් ප්‍රකාශයක් සිදුකරන,

සෑම අපේක්ෂකයකු ම, ඒ ඡන්ද විමසීම හෝ මැතිවරණය පවත්වන ලද 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නීතියක අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන අතර, නීති විරෝධී ක්‍රියාවක් සිදුකිරීම සම්බන්ධයෙන් ඒ නීතිය මගින් නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය

**9.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අපේක්ෂකයකු වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්වය" යන්නෙන්, යම් අපේක්ෂකයකුගේ ප්‍රකාශිත හෝ ගම්‍යවන කැමැත්ත මත පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ යම් පරිත්‍යාගයක් හෝ දායකත්වයක් අදහස් වේ;

"මැතිවරණ දිස්ත්‍රික්කය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ නිවේදනයක නිශ්චිතව දක්වා ඇති තත් කාලයේ බලපවත්වන මැතිවරණ දිස්ත්‍රික්කයක් අදහස් වේ; සහ

"පළාත් පාලන ආයතන" යන්නෙන්, මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.